# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1830/21 – 2013 ඔක්තෝබර් 01 වැනි අඟහරුවාදා – 2013.10.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39අ (1) වැනි වගන්තිය යටතේ නියමය

1988 සැප්තැම්බර් මස 22 වැනි දින අංක 524/19 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1988 අංක 252 දරන (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාවෙන් සහ අංක අ.ග.පි. 42 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 2643 යන ඉඩම රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 03ජේ/80/එච්ජ්/222.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 3/1/1/1(II).
2013 සැප්තැම්බර් මස 27 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේපත්තුව සුළු කොට්ඨාසයේ අයගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක අ.ග.පි. 42 සහ 2000.07.21 වැනි දින දරන පිඹුරේ කැබලි අංක 2643 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.054ක් පමණ වන අයගම වත්ත නමැති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 2643 – අයගම වත්ත – ප්‍රමාණය: හෙක්. 0.054ක් පමණ**

උතුරට: කැබලි අංක 2642; නැගෙනහිරට: කැබලි අංක 2171 1/2; දකුණට: කැබලි අංක 2171 1/2 සහ මහා මාර්ගය; බටහිරට: කැබලි අංක 2642.

10 - 458



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*